ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I,II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2012 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2012
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2012

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
I, II
Business and Accounting Studies I, II

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) **1** සිට **40** තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් **නිවරැදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.**

01. අවශ්‍යතා යනුවෙන් හඳුන්වන්නේ,
1. ව්‍යාපාර විසින් නිර්මාණය කරන්නා වූ දෑය.
2. මූලික තෘෂ්ණාවන් ඉටුකර ගැනීමට මිනිසා තුළ වන පෙළඹවීමේ ස්වභාවයයි.
3. වුවමනාවන් ඉටුකර ගැනීමට මිනිසා තුළ ඇති කැමැත්තයි.
4. වුවමනා සපුරා ගැනීමට යොදා ගන්නා විවිධ ස්වරූපයි.

02. පහත දෑ අතරින් ප්‍රාථමික නිෂ්පාදනයට අදාල නොවනුයේ,
1. ගොවිතැන් කිරීම. 2. ධීවර කර්මාන්තය
3. ගොවිපලක් පවත්වාගෙන යාම. 4. වඩු කර්මාන්තය.

வணிகக் கல்வியும் கணக்கீடும்

03. මේ අතරින් සාවද්‍ය බෙදාහැරීම් මාර්ගය වනුයේ,
1. නිෂ්පාදකයා ⟶ තොග වෙළෙන්දා ⟶ සිල්ලර වෙළෙන්දා ⟶ පාරිභෝගිකයා
2. නිෂ්පාදකයා ⟶ පාරිභෝගිකයා
3. නිෂ්පාදකයා ⟶ තොග වෙළෙන්දා ⟶ නියෝජිතයා ⟶ පාරිභෝගිකයා
4. නිෂ්පාදකයා ⟶ සිල්ලර වෙළෙන්දා ⟶ පාරිභෝගිකයා

04. හොඳ මුදලක ලක්ෂණයකි,
1. පොදු පිළිගැනීමක් නොතිබීම. 2. පහසුවෙන් හඳුනාගත හැකි වීම.
3. දුලභ වීම 4. බාහිර අගය අභ්‍යන්තර අගයට වඩා වැඩි වීම.

05. භාණ්ඩ හුවමාරු ක්‍රමය බිඳවැටීමට හේතුවක් නොවනුයේ,
1. අන්‍යෝන්‍ය වශයෙන් අවශ්‍යතා වල ගැලපීම
2. භාණ්ඩ රැස්කර තබා ගත නොහැකිවීම.
3. පරිවහනයට තිබූ දුෂ්කරතා
4. පහසුවෙන් කොටස් කර ගත නොහැකි වීම.

06. බාහිර පරිසරය අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි තර්ජනයකි,
1. ව්‍යාපාර වලට සුදුසු නීතිරීති
2. කාන්තාවන් රැකියා වල නිරතවීම
3. දේශපාලන අස්ථාවරත්වය
4. ළමා ජනගහනය ඉහළ යාම.

07. කේවල ස්වාමි ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක ඇති වාසියකි.
1. විවිධ හැකියාවන් සහ පිරිසකගේ සංකලනයකි. 2. ලාභය තනිව භුක්ති විඳිය හැකි වීම.
3. සීමිත වගකීම 4. නෛතික පුද්ගලභාවයක් තිබීම.

08. 2007 අංක 7 දරණ සමාගම් පණත බල නොපානුයේ,
1. සංස්ථාපිත සමාගම් 2. පුණ්‍ය සමිති 3. හවුල් ව්‍යාපාර 4. සමුපකාර

දෙවන පිටුව බලන්න

09. සමුපකාර ව්‍යාපාරවල ලක්ෂණයක් නොවේ,

1. ලාභ පරමාර්ථයෙන් කටයුතු කිරීම
2. ප්‍රජාතන්ත්‍රවාදි පාලනයක් තිබීම.
3. අතිරික්තය සාමාජිකයින් අතර බෙදීම
4. සාමාජිකයින්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම

10. බේකරි ආයතනයක් ආරම්භයේ දී බලපත්‍ර ලබා ගත යුත්තේ,

1. සෞඛ්‍ය අමාත්‍යාංශය
2. පලාත් පාලන ආයතනය
3. මධ්‍යම පරිසර අධිකාරිය
4. පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය

11. ව්‍යාපාරයක මානව සම්පත් වැදගත් වනුයේ,

1. ඉතා පහසුවෙන් පාලනය කළ හැකි වීම.
2. මානව සම්පත අජීවි සාධකයක් නිසා
3. ප්‍රතික්‍රියා දැක්වීමට ඇති නොහැකියාව
4. පුහුණුව තුළින් සංවර්ධනය කළ හැකි වීම.

12. වෙළෙඳ පොල අධ්‍යයනය මගින් හෙළිදරව් කරගත හැකි කරුණු පමණක් ඇතුලත් වනුයේ,

1. වෙළෙඳ පොල ස්භාවය, මානව සම්පත, නිෂ්පාදන ක්‍රම
2. වෙළෙඳ පොළ ප්‍රමාණය, තරගකරුවන්, පාරිභෝගිකයන්
3. ඉල්ලුම, අවශ්‍ය මුදල් ප්‍රමාණය, වෙළෙඳ පොල කොටස
4. භාණ්ඩයේ ගුණත්වය, අවශ්‍ය යන්ත්‍ර උපකරණ, නිෂ්පාදන ක්‍රම.


13. මුළු පිරිවැයට අන්තර්ගත වනුයේ,

1. සෘජු ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය, සෘජු වෙනත් පිරිවැය
2. ප්‍රාථමික පිරිවැය, වක්‍ර ද්‍රව්‍ය පිරිවැය, වක්‍ර ශ්‍රම පිරිවැය
3. ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය, පොදුකාර්ය පිරිවැය
4. පොදුකාර්ය පිරිවැය හා සෘජු පිරිවැය

14. වාණිජ බැංකු අනෙකුත් බැංකු වෙනස් කොට දක්වනුයේ,

1. ජංගම ගිණුම් පවත්වාගෙන යාම
2. මුදල් ණයට ලබා දීම
3. දේපළ වෙළඳාම් හා පුළුල් තැන්පතු පවත්වාගෙන යාම
4. ජංගම ගිණුම් හා විදේශ විනිමය ආශ්‍රිත සේවා පවත්වාගෙන යාම.

15. පහත සඳහන් රේඛන අතරින් පැවරිය නොහැක්කේ,




16. ටෙලර් කාඩ්පතක දක්නට නොලැබෙනයේ,

1. ගිණුම් අංකය
2. කාඩ්පත් හිමියාගේ නම
3. නිකුත් කළ දිනය
4. චුම්බක තිරුව

17. පහත දෑ අතරින් හානිපූරණ මූලධර්මය අදාල නොවන සිද්ධිය වනුයේ,

1. මෝටර් රථයකට සිදුවූ අනතුරක දී අලාභ ගෙවීම.
2. නිවසක් ගිනි ගැනීමක දී සිදු වූ හානියට අලාභ ගෙවීම.
3. ව්‍යාපාර ස්ථානයක් සොරු බිඳීම නිසා වන්දි ගෙවීම.
4. පුද්ගලයකුට සිදු වූ හදිසි අනතුරකදී වන්දි ගෙවීම.

18. රක්ෂණය මගින් සිදුවන වාසියක් නොවනු යේ,

1. ලාභ ලැබිය හැකි වීම.
2. විවිධ රැකියා අවස්ථා ජනිත වීම
3. ව්‍යාපාර කටයුතු සංවර්ධනය සඳහා උපකාරි වීම.
4. ආර්ථික සංවර්ධනය සඳහා උපකාරි වීම.

19. අභ්‍යන්තර සන්නිවේදනයට පමණක් අදාල පාර්ශවයන් වනුයේ,

1. අයිතිකරුවන්, පාරිභෝගිකයින්, සංවිධානය
2. අයිතිකරුවන්, කළමණාකරුවන්, සේවකයින්
3. කළමණාකාරුවන්, සැපයුම්කරුවන්, සේවකයින්
4. සේවකයින්, අයිතිකරුවන්, සැපයුම්කරුවන්

20. ගබඩා ලෙජරයක ඇතුළත් නොවේ,
1. ගබඩාවට ලැබෙන භාණ්ඩ
2. සැපයුම්කරුගේ තොරතුරු
3. ඉතිරි භාණ්ඩ ප්‍රමාණය
4. වටිනාකම

21. ගිණුම්කරණ ඒකක සංකල්පය යනුවෙන් හඳුන්වන්නේ,
1. ව්‍යාපාරය හා ව්‍යාපාරිකයා යන්න එකක් ලෙස සලකන බවයි.
2. ව්‍යාපාරයකට ගිණුම්කරණ කටයුතු සිදු කල යුතු විම අනිවාර්ය බවයි.
3. ව්‍යාපාරය අයිතිකරුවන්ගෙන් වෙන් වු ස්වාධීන ඒකකයක් බවයි.
4. ව්‍යාපාරික ගනුදෙනු අයිතිකරු විසින් පොත්වල වාර්තා කළ යුතු බවයි.

22. නිවැරදි ගිණුම්කරණ සමීකරණය වනුයේ,
1. ප්‍රාග්ධනය + වත්කම් = වගකීම්
2. වත්කම් - වගකීම් = ප්‍රාග්ධනය
3. වගකීම් + වත්කම් = ප්‍රාග්ධනය
4. වගකීම් - ප්‍රාග්ධනය = වත්කම්

23. වත්කමක ලක්‍ෂණයක් නොවනුයේ,
1. අතිත ගනුදෙනුවක ප්‍රතිඵලයක් විම.
2. පිරිවැය විශ්වාසනාවයකින් මැනිය හැකි විම.
3. ආර්ථික ප්‍රතිලාභ ලබා දීම.
4. ව්‍යාපාරයේ පාලනයට යටත් නොවීම

24. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1. ව්‍යාපාරයක් වසරක් තුළ නිදහස් කළ යුතු වගකීම් ජංගම වගකීම් වේ.
2. ව්‍යාපාරය තුළ වසරක් හෝ ඊට අඩු කාලයක් පවතින වත්කම් ජංගම නොවන වත්කම් වේ.
3. ව්‍යාපාරයක් වර්ෂයකට වැඩි කාලයක් තුළ නිදහස් කළ යුතු වගකීම් ජංගම වගකීම් වේ.
4. ව්‍යාපාරයක් තුළ වසරකට වඩා වැඩි කාලයක් පවතිනුයේ ජංගම වත්කම් වේ.

25. පහත සඳහන් ගනුදෙනු අතරින් එක් වත්කමක් අඩු වි තවත් වත්කමක් වැඩිවන ගනුදෙනුව වනුයේ,
1. අයිතිකරු විසින් ප්‍රාග්ධනය ලෙස මෝටර් රථයක් ගත්තා
2. රු. 10,000 ක් වටිනා ලි බඩු මුදල ට ගත්තා
3. ණයහිමියකුට රු. 3,000 ක් ගෙව්වා
4. විදුලි බිල ගෙව්වා රු. 1,750

26. රු. 5,000 ක් වටිනා චෙක්පතක් 10% කොමිස් මුදලකට යටත්ව සුනිල් ට මුදල් කර දිමට අදාල ද්විත්ව සටහන වනුයේ,

1.

| | | |
|---|---|---|
| මුදල් පොත | හර | රු. 5,000 |
| මුදල් ගිණුම | බැර | රු. 4,500 |

2.

| | | |
|---|---|---|
| මුදල් ගිණුම | හර | රු. 4,500 |
| ලද කෙමිස් ගිණුම | හර | රු. 500 |
| මුදල් ගිණුම | බැර | රු. 5,000 |

3.

| | | |
|---|---|---|
| මුදල් ගිණුම | හර | රු. 5,000 |
| ලද කොමිස් ගිණුම | බැර | රු. 500 |
| මුදල් ගිණුම | බැර | රු. 4,500 |

4.

| | | |
|---|---|---|
| මුදල් ගිණුම | හර | රු. 5,000 |
| ණයහිමි ගිණුම | බැර | රු. 5,000 |

27. පහත ගනුදෙනු අතරින් මුදල් පොතේ සටහන් නොකරන ගනුදෙනුව වනුයේ,
1. රු. 50,000 ක් අයිතිකරු විසින් යෙදවීම.
2. අයිතිකරු ප්‍රාග්ධනය ලෙස මෝටර් රථයක් ව්‍යාපාරයට යෙදෙව්වා.
3. ශානිකාගෙන් රු. 25,000 ක් වටිනා භාණ්ඩ අත්පිට මුදලට ගත්තා
4. භාණ්ඩ විකුණුම් රු. 10,000

28. දෛනික විකුණුම් පොත වඩාත්ම හොඳින් විස්තර කල හැක්කේ,
1. විකුණුම් ලැයිස්තුවක් ලෙසය.
2. ණයට විකුණුම් ලැයිස්තුවක් ලෙසය.
3. ගනුදෙනුකරුවන්ගේ ගිණුම් වල එකතුවක් ලෙසය
4. ද්විත්ව සටහන් තබන ලේඛණයක් ලෙස ය.

29. තිසර ව්‍යාපාරයේ දිනක් අවසානයේ රු. 3,000 ක අතැති මුදල් ශේෂයක් ද පහත වියදම් ද සිදු වි ඇත.

| | |
|---|---|
| ලිපිද්‍රව්‍ය | රු 350 |
| සිසිල් බීම | රු. 500 |
| ගමන් වියදම් | රු. 650 |

ඉහත තොරතුරු අනුව ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය කිය ද?
1. රු. 4,500
2. රු. 5,500
3. රු. 1,500
4. රු. 5,000

30. ගනුදෙනුකරුවෙකුට විකුණා ඇති භාණ්ඩ ආපසු භාර ගැනීමේ දී ඒ සඳහා භාවිත කරන ප්‍රභව ලේඛණය කුමක්ද?
1. හර පත්‍රය 2. බැර පත්‍රය
3. භාණ්ඩ ලැබීම් පත්‍රය 4. පිටත්කර යැවීමේ නිවේදනය.

31. එකක් රු. 15,000 බැගින් පරිගණක 10ක් TEC COM සමාගම වෙතින් ණයට ගන්නා ලදි. මිලට ගැනීමේ දි 10% ක වට්ටමක් ලබා දුන් අතර මසක් තුළ ණය මුදල් ගෙවන්නේ නම් තවත් 5% ක වට්ටමක් ලබා දෙන ලදි. නියමිත කාලය තුළ ණය පියවන්නේ නම් ගෙවිය යුතු වටිනාකම කීය ද?
1. රු. 142,500 2. රු. 135,000 3. රු. 128,250 4. රු. 127,500

32. රක්‍ෂණ වාරිකය සඳහා ගෙවූ රු. 20,000 ක චෙක්පත අගරු වී ඇත. මෙය චෙක්පත නිකුත්කරුගේ පොත්වල සටහන් කරනුයේ,
1. බැංකු හර රු. 20,000
රක්‍ෂණය බැර රු. 20,000
2. බැංකු හර රු. 20,000
අගරු චෙක් ගිණුම බැර රු. 20,000
3. අගරු චෙක් ගිණුම හර රු. 20,000
ගෙවිය යුතු රක්‍ෂණ බැර රු. 20,000
4. බැංකු හර රු. 20,000
ගෙවිය යුතු රක්‍ෂණ බැර රු. 20,000

33. පොදුකාර්ය පිරිවැය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,
1. පොදුකාර්ය පිරිවැය නිෂ්පාදිතයේ වටිනාකමට අදාල නොවේ.
2. ප්‍රාථමික පිරිවැයෙහි මූලිකාංගයකි.
3. වක්‍ර ද්‍රව්‍ය, වක්‍ර ශ්‍රමය වක්‍ර වෙනත් පිරිවැයෙන් සමන්විතය.
4. පොදුකාර්ය පිරිවැය යනු සියළු ඍජු පිරිවැය යි.

34. පහත තොරතුරු ඇසුරෙන් ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.
ඍජු ද්‍රව්‍ය 1,600 ඍජු වෙනත් 200
ඍජු ශ්‍රමය 1,200 කම්හල් පොදුකාර්ය 3,000
නිෂ්පාදනය කළ ඒකක ගණන 2000
1. රු. 2.80 2. රු. 3.00 3. රු. 4.40 4. ඉහත කිසිවක් නොවේ.

35. පහත සඳහන් හේතු අතරින් මුදල් පොතේ බැංකු තීරුවේ ශේෂය බැංකු ප්‍රකාශයට වඩා ඉහල අගයක් ගැනීමට හේතු නොවන්නේ,
1. නිකුත් කළ මුත් ඉදිරිපත් නොවූ චෙක්පත්
2. තැන්පත් කළ මුත් නිශ්කාශණය නොවී ඇති චෙක්
3. බැංකුව මගින් අඩුකර ගත් චෙක්පොත් ගාස්තු
4. ස්ථාවර නියෝග මත සිදුකළ ගෙවීම්

36. පහත සඳහන් ගනුදෙනු අතරින් ගැනුම් ජ'නලයේ සටහන් කරන ගනුනෙුවකි.
1. කමලාට ණයට විකුණුම් රු. 10,000
2. මෝටර් රථයක් සමන්ගෙන් ණයට ගත්තා රු. 300,000
3. රු. 12,000 ක් වටිනා භාණ්ඩ අත්පිට මුදලට ගත්තා.
4. තරිඳුගෙන් රු. 20,000 ක් වටිනා භාණ්ඩ ගත්තා.

37. ගිණුමක කාර්යභාරය ඉටුකරන මූලික සටහන් පොත වනුයේ,
1. විකුණුම් ජ'නලය 2. මුදල් පොත 3. ගැනුම් ජ'නලය 4. පොදු ජ'නලය

38. ශේෂ පිරික්සුමෙන් නොපෙනෙන දෝෂයක් නොවනුයේ,
1. අත්හැරීම් දෝෂය 2. මූල ධර්ම දෝෂය 3. ද්විකරණ දෝෂය 4. ඌනතා දෝෂය

39. කේ. ඒ පෙරේරාට ගෙවූ රු. 4,500 ඔහුගේ ගිණුමේ රු. 5,000 ක් ලෙස සටහන් කොට ඇති අතර ආර්. ඒ. පෙරේරාට ගෙවූ රු. 6,500 ඔහුගේ ගිණුමේ රු. 6,000 ලෙස සටහන් කොට ඇත. මෙම දෝෂය
1. ලිපිමය දෝෂය කි. 2. මූලධර්ම දෝෂයකි. 3. හිලව් දෝෂයකි. 4. ද්විකරණ දෝෂයකි

40. කුසුම්සිරිගේ ගිණුමේ රු. 351 ක් ලෙස තිබිය යුතු ශේෂය 153 ක් ලෙස පහලට ගෙන ගොස් ඇත. පහත සඳහන් ඒවා අතරින් මෙය කවර දෝෂයක් ද?
1. මූල ධර්ම දෝෂයක් 2. අතිරික්තතා දෝෂයක්
3. හිලව් දෝෂයක් 4. ද්විකරණ දෝෂයක්

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර